# 19

ඇගේ අඳුර නිසා හවස වේලාව කිම අපහසුය. එහෙත් තම ජංගම දුරකථනයේ මුහුණත බැලූ බිමල්ට දැන් හයට ආසන්න බව පෙනුණි. තමා දැන් යළිත් ගඟසිරි හෝටලයට ගියොත් --- උදයසිරි කැඳවේවි. උදයසිරි මුණ ගැසීම රාත්‍රී ආහාරයට තබා ගත යුතුය. එවිට උදයසිරිගේද කතාව ලෙහෙසි වෙයි. තමා එයට පෙර තම මුහුණ ඔහුට පෙන්විය යුතු නොවේ. තමාගේ ඉල්ලීමේ වැදගත් කම තබා ගැනීමට තමා කාලු බාල විය යුතු නොවේ.

හවස තේ වතුරට හෝ රාත්‍රී කෑමට ගඟසිරි හෝටලයට නොයන්නට ඔහු තීරණය කළේය.

තක බුද්ධියෙන්ම මෙන් නැවතුණ බස් රියට ඔහු ගොඩවුනේ හේතු දෙකක් නිසාය. එක් හේතුවක් වැස්සෙන් බේරෙනටයි අනෙක - අද ගමන් ගත් අතට ගමන් ගැනීමයි.

එහෙත් බස් රියට නැංග පසු කොතෙක් දුර යන්න දැයි ඔහුට තේරුමක් නොවීය.

ඔහු බස් කොන්දොස්තරට, තමා අතලූ කාසියෙන් ලිබිනය පෙන්වීය. "ඔයාස් මවත" කොහෙටදැයි කොන්දොස්තරගේ ප්‍රශ්නයක් නොවීය. "අතුරු හරක් වෙන්වැනි" යි කොන්දොස්තර කීවේ එක් සීමා දුරකට ටිකට් පතක්, බිමල් අතට දෙන අතරේය. ~~බස~~ බස් රිය තුල එතරම් සෙනගක් නොවීය.

බිමල් පසු කොටසේ ආසනයකට බරවූ තම දුරකථනයෙන් ඇගේ නොම්මරය එබුවේය. එහා පසින් ඇසුණ කාන්තා කට හඬ ඇගේ නොවීය.

'මේ වෙලාවේ එය විසන්ධි කර ඇති බවක්' කියැවුණි. බිමල් තුල නොඉවසිල්ලක් හටගති.

වැඩිදුර යාමට පෙර අද සිටින තැනක් සොයා ගත යුතුය. ලොකු ඔරලෝසු කණුව පසු කරන්නම ඔහු බස්රියෙන් බැස්සේය. 'බැස්සා' නොව, රථය මන්දගාමී වෙන්ම ඔහු පිටතට පැනගත්තේය. මද වැස්සෙන්ම ඔහු උගම කඩපෙලියේ මුල්ම කඩයට ගොඩ වුණේය. එතැන පත්තර විකුණන තැනකි. කාන්තා වැඩ සඳ 'පනදින' පත්‍රයේ පිටපත් කීපයක්ද එතැන අනෙක් පුවත්පත් අතර තිබුණි. එක් 'පනදින'ක් සිත් ලදු වටක වාගේ ස්ලාඝ්‍යයක එලවුණි.

'තාත්තා නැතිව ඒ පත්තරේ මොනවටද?' විමල්ට සිතුණි. අනතුරුව 'තාත්තා ලියූ යමක් පත්තරේ ඇත්ද?' යි ඔහුට සිතුණි.

"මොන්නය පත්තරයක් ගන්නවද?" කඩ හිමියා ඇසුවේ විමල්ගේ කල්පනාවලිය බිඳිමිනි.

"නෑ - නෑ මං මේ කුඩයක් ගන්න තැනක් බලනවා."

"ඔව කඩ දෙකක් එහාට යන්න ඔහොමම" තරමක් කඩ හිමියා මග පසට ඇඟිල්ලක් දිගු කළේය.

ජනප්‍රිය පුවත්පත් තවමත් ලනුවෙන් එල්ලුණේ වවුලන් මෙනි. තාත්තාගේ නම ඒ පුවත්පතේ ඇත්ද? නෑ - මොන බෑ. පත්‍රයේ ප්‍රධාන කතෘ අතුකෝරාල - තාත්තාගේ නම කවුහා පරාරය. තාත්තා අතුරුදහන් වී ඇති බවක්වත් පත්‍රයේ සඳහන් වුනාද? නෑ නෑ - - වසර ගණනාවක් කළ සේවයට ලැබෙන උපහාරය ඔය තමා - - ගඟට කැපූ ඉණි!

පුවත්පත අමතක කරමින් විමල් කුඩ ඇතැයි කියූ කඩයට පියමැන්නේය. එතැන කුඩා කඩයකි. කුඩා පෙට්ටක් තෙල, වැලි කබ, බේවල් කූඩ හා වෙනත් නොයෙක් ලෙට ලොකට බඳුන අඩ අඳුරේ ගොඩ ගසා තිබිණි.

"කුඩයක් ගන්න ඕනෑද?" අඩ අඳුරේ හිඳ සිටි ගෑනියගෙන් විමල් ඇසුවේය.

"ඔය තියෙන්නෙ - තෝරලා ගන්න," ඈ කීවේ අමනාපයකින් මෙනි. මේ මිනිස්සුන්ට මොනව වෙලාද? තමා ආවේ මුදල් දී කුඩයක් ගන්න - හිඟන්න ආවාද? ඉදිරියේ තිබ් වානේ පටි වලින් වටවූ ටැංකියක් වැනි තැනක නොයෙක් වර්ගයේ අකුලන කුඩ තිබිණි. ඒ අසලම ඉහළින් එල්ලුණේ දිග කුඩ ගණනාවකි.

අකුලන කුඩයක් තෝරන අතරේ විමල් ගෑනිය දෙස යන්තම් බැලුවේය. ඈ අහක බලාගෙන. මැදිවියේ ගෑනියක් - - ඔහේ ගත වෙන ජීවිත - - සමහර විට ඇයගේ ගෙදර හරි හැටි කෑමක් ලැබෙන්න නැතුව ඇති - ඒකයි ඔය දුර බැල්ම - - විමල්ට සිතුණි. සමහර විට මිනිහෙක් නැතුව ඇති - - අර මේසන් මේ ගෑනියත් අතර කොතරම් මොකක් තියෙනවද? සමහරවිට හැම පාතර ජාතියක ගෑනු ඇති - - හැම පාතර මායම කියන්නෙ ඒක මොන්නත් - -

"සෝරම එක ගන්නං" ගැහැණිය ඈතින් සිට කීවාය.

"කීයද?"

"ඕව්වා දෙසීයයි."

ඈ ගන්නා කියන්නේ ඇගටම නොදැනිය.

බිමල් තද නිල් පාට කුඩයක් ගෙන දිග හැර බැලුවේය. චීනේ හදපු එකක් වෙන්නැති- වෙන කොහේද?

"ගන්නවද?"

"ඔව් - ඔව්."

"අද දිගටම වහිනවනෙ"

"ඔව් - ඔව්" කී බිමල් කුඩය හකුලා දෙකකුල් අතර රඳවා ගෙන සාක්කුවෙන් ගත් පසුම්බියෙන් රුපියල් දෙසීයක් ඇද ගත්තේය. ගැහැණිය ඔහුගේ දෙකලවා අතර රඳුණ කුඩය දෙස බලා සිටියාය.

බිමල් නෝට්ටු දෙක දිග කරන්නම ඈය ඔහුට ලංවුනාය. මුදල් ගන්නා අතරේ ඈ සිනාසුණේ ඔහුගේ දෙකලවා අතර තැඹුන කුඩය දෙස බලමිනි. 'මේ ගෑනිගෙ ඇගේ ඇතුලෙ කොහේ හරි සතුටක් තියෙනවා' ඒ සිනහව දකිද්දී බිමල්ට සිතුණි.

කුඩය අතකින් ගත් බිමල් අනෙක් අතින්, කමිස සාක්කුවේ තිබූ කාඩ්පත ගත්තේය.

"මේ ඇඩ්‍රස් එක තියෙන හරිය දන්නවද?" සීතලයෙ බිඳුණු ගැහැණියගෙන් ඔහු ඇසුවේය.

ගැහැණිය කාඩ්පත ගෙන බලා "ආයෙත් ඔහොම හන්දියට ගිහින් දකුණට හැරිලා ගොඩ පැත්තට යන්න. වම් පැත්තට තියෙනවා ඔය කියන පාර" යැයි කීවාය.

"බොහොම ඉස්තූතියි."

"ඔය මාවත ඉවර වෙන්නෙ ගඟ ඉද්දරින්" ඈ උවමනාවටත් වඩා යමක් කීවාය.

"ඉස්තූතියි."

කුඩය ඉහලාගෙන පාරට බට බිමල් තමා අතට ආ මුල්ම ත්‍රිරෝද රථයට අතක් දිග කළේය.

රියදුරා තරුණයෙකි.

"ඔයාස් මාවතට -" බිමල් කීවේ පලපුරුදු කාරයෙකු මෙනි. 'කීයක් ගන්නවාද?' යි අසන්නට උවමනාවක් නොවීය. රියදුරාට

ඉහළින් මීටරයක් තිබුණ නිසාවිනි.

ඇගේ කෝඩය මැදින්, රියදුරා රෝද තුන කැබ්රථයේ ප්‍රවීණ කාරයෙකු ලෙසිනි. හිරිපොදය බරින් බර, දෙපස ආවරණය කළ කැන්වස් රෙදි අතරින් ඇඟට වදින්නට නිමල්ට ඒ ගැන වගක් නොවීය. මේසාව යළි දකින අපේක්ෂාවෙන් අනෙක් සියල්ල සමාන් වී ගියේය.

ඇගේ තීරය මැද්දෙන් හමාගත් රථය ඩයස් මාවතෙන් හැරී ගඟ දිසාවට ඇදුණේය. පාර පටු විය. මෙකියන ලිපිනය කොතැනදැයි හරිහැටි නොදත් හෙයින් දැන් ගමන සෙමින් විය. කාර පාර වලින් වල කැඩුණු එකකි. එහෙත් මේසා ඉරා දැකීමේ අභිලාෂය මත්තේ වල ගොඩැලි අමතකය.

ඇතැම් වැසුණු ගේට්ටුවක නොම්මර සඳහන් විය. ඇතැම් තාප්පයක ලියූ නොම්මර මැකී යමිනි. වැස්ස නිසා පාරේ මිනිස්. නොරය. පාර කෙළවර වෙන තැනම මෙන් දකුණු පස "112" යන නොම්මරයේ සටහන් ගේට්ටුවක් විය. ගේට්ටුව වසා දමලාය. මේසා දුන් නොම්මරය 112 1/2 යි. එහෙම නම් එයත් ඇත්තේ මේ ගේට්ටුවෙන් ඇතුළත විය යුතුයි.

"මහත්තයා බහිනවද?" රියදුරා ඇසුවේ තවම එන්ජිම පත්තු තබාගෙනය.

"ඕ- ඔව්- ඔව්."

"මං - ඉන්නද?"

"න.. නෑ. එපා. දැන් හරි"

නිමල් මීටරයේ බලා රුපියල් තුන් සියයක් රියදුරා අත තබා "ඉතුරු ඔයාට තියා ගන්න" කියා රියෙන් බැස්සේ කුඩය දිග හරිමිනි.

මේ විදියට මුදල් නාස්ති කළ නොහැක. තමා අ, කාපිය නෙකෙකි. දැන් මේ 'මේසාව', මේ වලාකුල කොහොන්දෝ තබා, වැලී තමාව තෙත බරියන් කරයි. ත්‍රිරෝද රථය හරවා ගත් රියදුරා ගඩ ගඩ හඬ නංවා දුම් රොටු මවා ඈතට ඇදී වලංගුවෙන් නොපෙනී ගියේය.

කුඩය යට සිට ගේට්ටුව වෙතට හැරුණු නිමල් ඒ උස් යකඩ ගේට්ටුව අසල කුළුණේ වූ සීනු බොත්තම තද කළේය. ගේට්ටුව කිරි කිරි ගාමින් ලත්කකට ඇදී යත්ම නිමල්ට පෙනුණේ කෙට්ටු, කලු සිරුරක් සහිත මිනිසෙකි. ඔහු සුදු බැනියමක් හා කලු සරමක් ඇඳ

සිටියේය. ඔයාගේ දෑසේ බැල්ම තිබ්බය.

" එකසිය දෙදහස් දෙකොස් එක ? " විමල් ඇසුවේය.
" මේසා නෝනා ? "

" නෝ - නා ? " කී මිනිසා ඉක්කාවක් ගසන්නාක් සේ " ඉන් - නෑ " කියා දෙමහල් ගෙය දෙසට පිය මැන්නේය.

විමල් " ඉන්නෑ " නැතිව මිනිසා පසුපසින් කුඩා උද්‍යානයක් වන් මිදුලට ඇතුළු වූයේ තමන් කුඩය ඉහලා ගත් හමන්ය.

ගෙට යන කුඩා පාර දෙපස අන්දර වැටක් වැඩී තිබිණි. එයින් ඔබ්බෙහි උස් සෙවන දෙන ගස් සහ පාට පාට කැනාස් මල් සහිත පදුරු. රෝස මල් පිපි කරමක් උසට වැඩුණු රෝස පදුරු. දෙම් කැටුණු සහිත ඉස්තෝප්පුවක්. බාගෙට ඇරුණු ඉදිරි දොර අගනා දැවයෙන් කළ එකක්. ඒ දෙපස සිදු වීදුරු කවුළු ආවරණය කරමින් ඇතුළත ලේස් තිර රෙදි යන්තමට පෙනුණි. ඉස්තෝප්පු බිම රතු ගඩොලින් බැරින් වෙලාය.

මිනිසා හයිස්සේ දොර අතලලා දොර වඩාත් විවර කරන්ට විමල්ට ඇතුළතින් පියානෝ වාදනයක් ඇසෙන්නට විය. මිහිරි නාදයක්. බටහිර සම්භාව්‍ය සංගීත ඛණ්ඩයක් - බීතෝවන් - බාක් - මෝට්සාට් - - ඉතින් නම් විමල්ට මතක් වූයේ තාත්තා මේ නම් සඳහන් කර තිබුණ බැවිනි.

'තාත්තාට කොහොම ඇද්ද ? තාත්තා කොහේ ඇද්ද ?' ඔහු සිතුවේ කුඩය හකුළමින් දොරකඩ සිට හතිද්දීය.

පියානෝ වාදනය නතර විණි.

රෝස, රතු, සුදු මල් සහ ලා කොළ පැහැ කොළ සිත්තම් වැටුණු සිදු ගවුමක් හැඳගත් මැදිවියේ පැහැපත් ගැහැණියක් දොර වෙතට ආවාය.

" කා - වු - ද ? " ඇය ඇසුවේ විපරමේ දෑසකින්, ගුතුව, රහසේ මෙනි.

" මං - ආ - මං ආවේ මේ එකසිය දෙළහ දෙකොස් එක ? " විමල් කලබලයෙන් කිව නැවති නැවති කීය.

" උඹ තමුව. " ගැහැණිය ඇඟිල්ලක් ඉහළට දිග කළාය. සියුමැලි සුදුමැලි ඇගේ අතැඟිලි කිපයකට මුදු ලෙලෙවිණි.

" මෙයා ? "

" ඔව් - ඔව් වළියෙන් පසිවේ දිය. "

"හොඳයි."

"ඉන්නවද දන්නෙ නෑ- ගිහින් බලන්න" හැඳිනිය කීවාය.

ඉදිරි දොර වැසුණි. විමල් ඉස්තෝප්පුවේ සිට නැවී බලද්දී දුටුවේ, තමාට මඟ පෙන්වූ මිනිසාවයි.

ඔහු තනාබව ඉදිරියට ඇඟිල්ලක් දිගු කළේය.

"මේ මිනිහා හොල්මනක් වෙන්නැති" යි විමල්ට සිතුණි.

ඉස්තෝප්පු කෙළවරට ගිය විමල් එතැනින් උඩට නැගිය පඩිපෙල දුටුවේය. එහෙත් පුළුල් නොවූ සිමෙන්ති පඩිපෙල මායිම් කරමින් සුදු සිමෙන්ති අත්වාරු බැම්මක් නැගිනි. ඒ නිසා අත්වාරුව අල්ලාගෙන උඩට නැග විමල් විවර කොලොල්ලක් උඩ නතර වූයේය. මේ දොර ඉමුණින් ඇතුළට වූයේ අඳුරු කොරිඩෝ මගකි.

ඊට එක් පසෙක - වම් අත පැත්තට වැසූ දොරක් විය. තවත් හොඳින් බලද්දී දකුණු පැත්තටත් - තවත් මෙවැනි වැසූ දොරක් ඇති බව විමල්ට පෙනුණි.

වම් පස වූ දොර ළඟ බිත්තියේ, 112 1/2 කියා ලියා තිබිණි.

මේසා දුන් ලිපිනයේ වූයේත් මේ නොම්මරයයි. විමල් සැහැල්ලු සුසුමක් හෙළා දොරට තට්ටු කළේය. යළිත් තට්ටු කළේය.

සියල්ල නිසලය. ඇතුළතින් [illegible].

මේසා නැත.

අඳුරු කොරිඩෝරයේ මැදක් තෙක් ගිය විමල් දකුණු පැත්තේ වූ දොරට තට්ටු කළේය. එතැන නොම්මරයක් නොවීය.

පිළිතුරකුත් නොවීය.

මේසාව සම්බන්ධ කරගන්නේ කෙසේද?

ඇයි! දුරකථනය! හදිසියේ යමක් මතක් වූනාක් මෙන් කොරිඩෝවේ විවර කෙළවරට ආ විමල් පිටත වූ කෝඩය අස්සෙන් පෙරී ආ මද එළියේ සිට මේසාගේ නොම්මරය කඩදාසියෙන් බලා දුරකථනයේ මුහුණත නොම්මර ඇඟිලි තුඩින් එබුවේය.

මේ වතාවේ නම් ඔහුට ඇය හා සම්බන්ධ විය හැකිවිය.

"මේසා?"

"ඔව්! හලෝ!"

"ඔබ මතකද? මේ නිමල් - අද හම්බවුනේ?"

"ඔව් - ඔව් - ඔයා කොහේද?"

"ඔයාගෙ කාමරේ දොරකඩ."

"හරි ළමයෙක්නෙ? හොයාගෙන ආවා - නෙ?"

"ඇයි? නරකද?"

"නෑ නෑ - අනේ මෙයා - මං තාම ඉන්නෙ යාළුවෙකුගෙ ගෙදර - ඩිනර් එකක් - තියෙන - වා"

"මං හිතුවෙ --"

"මොනවද ඔයා හිතුවෙ?"

"ඔයත් එක්ක ටේ කෝප්ප හරි බොන්න යන්න."

එහා පසින් සීන් සීනු සිනා හඬක් නැගිනි

"ටේ බොන්නද ඔච්චර දුර ආවෙ?"

"නෑ කතා කරන්නත් එක්-ක."

"මේ - ඔයා කොහේවත් යන්න ඕනෑ නෑ. ඔහොම පල්ලෙහාට යන්න. පල්ලෙහා ඉන්නෙ ආන්ටි ගිල්ඩා."

"මට හම්බ උනා. අර පියානෝ ගහන එක්කෙනා?"

"ඔව් - ගිල්ඩා දුනුවිල - ඔයා පල්ලෙහාට යන්න. එයා ටේ එකක් හදලා දෙයි - රංගාවට."

"රංගාවට?"

"මං එනකල් ඉන්න."

"මට තව ගමනක් තියෙනවා - කෙනෙක් මුණ ගැහෙන්න"

"කොහේද? කීයටද?"

"රෑ දහයමාරට --"

"හොඳටම රෑ වෙලා නෙ ළමයෝ."

"නෑ එහෙමනං කමක් නෑ - මං ඒ ගමන කලින් ගිහිං එන්නං."

"අන්න - හොඳ ළමයා!"

"මං එහෙනං --"

"මේ ඔයා ඔහොම පල්ලෙහාට යන්න. මං ආන්ටි ගිල්ඩාට කතා කරල දැන් කියන්නං ඔයාට උණු උණුවට ටේ එකක් හදල දෙන්න කියලා. ඊට පස්සෙ --"

"ඊට පස්සෙ එහෙම නං මං ගමන ගිහිල්ලා පුළුවන් ඉක්මනට ආපහු එනවා."

" මමත් එහෙම නං ඔය නමය වෙනකොට එන්නං. "
ඈ දුරකථනය විසන්ධි කළාය.

ඈ විශ්වාසයට ගත හැකිය. නමාට එක ගලෙන් කුරුල්ලන් දෙදෙනෙකු විද ගන්නට ලැබේ. එකක් නම් - උදයසිරි මූණ ගැසී ලිපිය ගැන තොරතුරු සොයා ගැනීමයි. අනෙක නම් - මේසා වැනි ගැහැනියක හා රැය කීපයක් හෝ ගත කරන්නට ලැබීමයි.

බිමල් සෙමින් සෙමින් පඩිපෙළ බැස්සේය. වැසි දියෙන් තෙමුණ පඩි ලිස්සන සුළු විය. ඉස්තෝප්පුවට ආ ඔහු කුඩය දිග හැර තෙත බේරෙන්නට තැබුවේය. කලින් ඔහු දුටු වෙහෙකරුවා දොර හැර බැලුවේය. තම පිටෙහි එල්ලා ගෙන සිටි ගමන් මල්ල සකස් කර ගනිමින් බිමල් යන්තමට සිනාසුණේය.

එහෙත් වෙහෙකරුවාගේ මුහුණේ ප්‍රතිචාර සිනාවක් නොවීය. මේ මිනිසා ගොළුවෙක් වෙන්නැතැයි බිමල්ට සිතුණි. හරියට සොම්බියෙක් වගේ -

" එන් - " මිනිසා එන්න කීවේ ඒ අයුරෙනි.

බිමල් බාගෙට ඇරුණු දොරෙන් ඇතුළුවූයේ එක් පහනක් දැල්වෙන ශාලයකටයි. ඒ ~~[illegible]~~ විදුලි පහන, විසිතුරු අගනා වීදුරු ආවරණයකින් වැසී, බිමින් නැගෙන රන්වන් ආධාරක පොල්ලක් මුදුනේ රඳුනේ, දිලිසෙන කළු පැහැ ග්‍රෑන්ඩ් පියානෝවක් අසලය. ගිල්ඩා දුනුවිල පියානෝව වයන්නට හිඳගන්නා බංකුවේ මැද දුරකථනයෙන් කාටදෝ කතා කරමින් සිටියාය.

බිමල් ඔහු දකින්නම ඇය ඔහුට අතකින් සන් කළේ ඕනෑම අසුනක වාඩි ගන්නටයි.

" හොඳයි - හොඳයි - කෙල්ලේ - හරි - හරි " ගිල්ඩා දුනුවිල සැහැල්ලුවකින් සිනාසෙමින් දුරකථනයෙන් කතා කළේ දෙපය එකිනෙක පටලවමින් හා ඇඟිලි හා සෙල්ලමක් කරන ආකාරයෙනි.

බිමල් සුව අසුනක හිඳ වට පිට බැලුවේය. මේ ශාලයේ අසුන් සියල්ල සුව පහසු ඇති ඒවාය. පාට පාට පුළුන් කොට්ට, වැතිරෙන සෝපාවන් දෙකක තිදෙනා නැගිත් හිඳගත හැකිය. ඒ හැරෙන්නට තද රතු පැහැයෙන් යුතු ඕර දැමූ ලීයෙන් කළ

වන් සංගීත පුවූ චීන ආරක් ගත් ඒවාය. අගනා පළිඟුවන් වීදුරු බඳුන් එක ගත්, වීදුරු මූර්ති සංගීත ප්‍රදර්ශන අල්මාරිය අඩි හයක් තරම් උසය. ඒ මත්තේද විසිතුරු භාණ්ඩ කීපයක් තිබිණි

~~සිවිලිමෙත්~~ සිවිලිමෙන් එල්ලුණ පළිඟු පහන් වැල්ලද ලොකු එකක් විය හොහේ. මේ හැටි මේ සේරම වස්තුව හම්බ කරන්න මොන වගේ රස්සාවක් කරන්නට ඇද්දැයි බිමල්ට සිතුණි. ඇය මේ සේරම වස්තුව හොවිතෙ අර පියානෝව වාදනය කරලාද? ඒ නැත්නම්...

සමහර විට ඇය ධනවත් පවුලකට උපදෙන්නට ඇතැයි අනතුරුව ඔහුට සිතුණි. ඇගේ කටහඬේ ඒ ධනවත් බව රදේ.

ඇය "ඩෙරියෝ" කියා ඇද ඇද තවත් වචනයක් දෙකක් ඉංග්‍රීසියෙන් දෙඩා යළිත් ඩෙරියෝ කියා දුරකථනය පසෙක තබා බිමල් වෙතට අවධානය යොමු කළාය.

"ඉතිං ?" ඇය කියා, බිමල් යමක් කියන්නට පෙර, "ඔන්න ඔයාට තේ එකක් දෙන්න කියලා මට ඕඩර් එකක් ආවා" යි කීවාය.

බිමල් සිනාසුණා පමණි.

ගිල්ඩා සෝෆාවකට බර දෙමින් "මොකක්ද නම ?" කියා විමසුවාය.

"මම - බිමල් -"

"බිමල් ? කොහේද ගෙවල් ?"

"අපි ඉන්නේ ගොඩ -"

බිමල් තවත් යමක් කියන්නට පෙර ගිල්ඩා දුනුවිල සේවකයාට හඬ ගෑවාය.

"ඇල්බි - තේ එකක් හදන්න කියාපං."

ඇල්බි නිහඬවම මුළුතැන් ගෙය සොයා ගියේය.

මේ මිනිහා ~~[illegible]~~ ටෝම්බියෙක් වගේ, බිමල්ට සිතුණි.

"කොහොමද - අපේ මේසාව අඳුනන්නෙ?" ගිල්ඩා ඇසුවේ ඇද ඇදලාය.

මේසාගේත්, ගිල්ඩාගේත් සම්බන්ධතාවයත් නොදත් නිසා බොරුවක් කීමට බැරිය.

"අපි- උගඩි දැන අඳුනගත්තෙ. මං කලුතර බෝධි පූජාවකට ආ වෙලාවෙ-" එහෙම කියන එක කොයිකටත් හොඳයි. බොරුවකුත් නෙවි. පූජනීය කර්ම කටයුත්තකදි. පූජනීය ස්ථානයකදි මූණ ගැසීම - ගැටයක් නෙවි.

"ඒ උමයට කෙළවරක් නැති වැඩ." ගිල්ඩා කීවාය. "මේ- උමය මොනවද කරන්නෙ?"

"මං.. මං විභාග ඉවර කරලා- බලං ඉන්නවා."

බිමල්ගේ පිළිතුරට ගිල්ඩා සිනාසුණාය. "බලං ඉන්නවා- නේද? ගොඩාක් අය විභාග කරලා බලං ඉන්නවා." ඇය යළිත් සිනාසුණාය.

"සමහර අය විභාග නොකරත් බලං ඉන්නවා," බිමල්ට කියැවිණි.

"ඒක හරි" කී ගිල්ඩා, එය මහා විහිළුවක් සේ සලකා හඬ නගා සිනාසුණාය.

ඇල්ෆි බන්දේසියක තේ කෝප්පයක් තබා ගෙන ආවේය. ඔහු එය බිමල්ට දිගු කරද්දී ඇල්ෆිගේ අත් වෙව්ලුවේය. 'මේ මිනිහා කොයි තරම් බයාද' දැයි බිමල්ට සිතුනි. බිමල් ඇල්ෆිගේ ඇස් දෙස බැලුවත් ඇල්ෆි හිස් බැල්මකින් බිම බලා සිටියේය.

'මේ මිනිහා නම් සෝම්බියෙක් වගේමයි' බිමල්ට යළිත් සිතුණි.

බටහිර අප්‍රිකාවේ දැරුම් බටහිර ඉන්දියානු කොදෙව් දූපත් වලත්, හයිටි දූපතේ සේම ~~දකුණු ඇමෙ~~ අමෙරිකා එක්සත් ජනපදයේ දකුණු දිගට ගං ආක්‍රමණය වූ සෝම්බි (අවතාර) කතා බිමල් අසා තිබුණේ තාත්තාගෙනි. දකුණු අප්‍රිකාවේ ඇරඹි වුඩූ කල්ලි වල අය මළ මිනී වලට මොනත් බලවේගයක් මන්ත්‍ර බලයෙන් ඇතුලත් කරමින් ඒවායෙන් වැඩ ගත් ආකාර බිමල් කුඩා විටෙ අසා සිටියේ අසීමිත කුතුහලයකිනි. සෝම්බි යන වචනය - ඇවිදින මළ මිනී යන අරුත ගන්නේය. සෝම්බියෝ කතා නොකරති. කියන දෙය සෙමින් කරයි. හිතක් පපුවක් නැතිව ඔහේ ඇවිදිති. ඒ ඇවිදින ආකාරයත් මිනිස් ආකාරයට වඩා වෙනස්ය. මේ 'ඇල්ෆි' දකින විට බිමල්ට සිතුනේ තමා චිත්‍රපටියක දුටු සෝම්බියෙක්. ඇල්ෆි තුළ වූයේ යම්කිසි අස්වාභාවික බලයක් යැයි සිය ඇවිද

යන දෙස බලා සිටි බිමල්ට සිතුණි.

"තේ එක රසයිද බිමල්? මොකද්ද කල්පනාව?"

ගිල්බට්ගේ දෙපැනයෙන් බිමල්ගේ සිතුවිලි වලිය බිඳී ගියේය.

"ඕ?"

"තේ එක හොඳයිනෙ?"

"ඔව් - ඔව් - රසයි." ඇත්තෙන්ම එහි සීනි වැඩි විය. "හොඳට සීනි රසයි."

දෙවැනි ප්‍රශ්නයට පිළිතුරු දෙනු වෙනුවට, බිමල් ඇසුවේ වෙනම ප්‍රශ්නයකි.

"ඇල්බින් මේ ගමේද?"

මේ වෙන විට ඇල්බි ගෙතුලට නොපෙනී ගොසිනි.

"ඔව් - ඔව්" ගිල්බට් කීවාය. "මගේ යාලුවෙක් - වැඩට කියාලා ගෙනැත් දුන්නා. කිසි කරදරයක් නැ - වැඩක් පලක් කරගෙන ඉන්නවා."

"කතා කරන්න බැරි කෙනෙක්ද?"

"කන ඇහෙනවා ටිකක් අඩුයි. මෙහේ ඉතින් කතා කර කර ඉන්න කියල කෙනෙකුත් නැහැ - නෙ - නේද?" ගිල්බට් සිනාසුණාය. "ඒ විතරා ඔහේ ගාඩුනෙ වත්තෙ පිටියෙ ගෙදර දොර වැඩක් කරගෙන ඉන්නවා."

"දරු මල්ලො කවුරුත් නැ?"

"කවුරුත් නැ -" කී ගිල්බට් සුසුමක් හෙලුවාය.

ගිල්බට්ට දරුමල්ලන් නැත්ද? අනතුරුව බිමල්ට සිතුණි. එහෙත් ඇගෙන් පුද්ගලික තොරතුරු ඇසීම නොමනාවයි අනතුරුව සිතුණි. තේ කෝප්පය තොල ගාමින් වට පිට බැලූ බිමල්ට බිත්තියක එල්ලෙන ඡායාරූ කීපයක් පෙනුණි. ඔහු නැගිට ඒ වෙත ගියේය.

"ඔය මගේ පවුලෙ උදවිය -" ගිල්බට්ගේ කතාවේ ආඩම්බරයක් විය. "ඔය උඩම පින්තූරෙ ඉන්න ජෝඩුව අඳුනනැතිද?"

"ගිල් - බට් - ?"

"ඔව් මම තමයි. මායි මගේ මහත්තයයි.

"එයා ඩොක්ට කෙනෙක්. දැන් නැති වෙලා ටිකක් කල් - ඔය පහත පින්තූර වල ඉන්නෙ - මගේ පුතයි - දූලා දෙන්නයි."

"කෝ ඉතින් ඒගොල්ලො?"

"සේරම - පිට රට. පුතා අමෙරිකා. ලොකු දුව ඉන්ග්ලන්ඩ් - පොඩි දුව ඔස්ට්‍රේලියා - ."

"ඉතිං මිසිස් දිසාවිල එහේ යන්නෙ නැද්ද?"

"ආ - පෝ - මං ගිහින් ආවා - ඔය ඇම තැනම - ඒ උනාට මෙහේ ගෙදර තරම් නෑ ළමයො - ඔය එක තැනක්වත් - මට හොඳයි මෙහේ."

"ඒක නං ඇත්තයි."

"ඒ ළමයින්ට - ඒ ගොල්ලන්ගෙ ජීවිත තියෙනවා - බැඳල දරුවො ඉන්නවා. මෙහෙ ඇවිත් යනවා - මට කිසිම දේකින් අඩුවක් නෑ ඒ ගොල්ලන්ට මාව බල බලා ඉන්න ඉවයෙක් නෑ - හරිම බිසී දන්නෙ නැද්ද ඒ රටවල් වල ලයිෆ් එක."

"ඒක ඇත්ත" කී බිමල් මෙතෙක් අතේ තිබූ තේ කෝප්පයේ අන්තිම උගුරත් බී එය කෝපි මේසය මත තැබුවේය.

"දැන් ඉතින් බිමල් මොකද කරන්නෙ?"

"වැස්ස පෑව්වනෙ - මං යනවා. කෙනෙක් හම්බුවෙන්න තියෙනවා. මං -- " කී බිමල් අසීරුවෙන් කතාව නතර කළේය.

"ඔව් යන්න. බලං ඉන්න එකේ තේරුමක් නැනෙ. මේසා රෑ වෙච්චි - මගෙත් පියානෝ ලෙසන් එක ගන්න ගෝලයෙක් එනවා තව ටිකකින්."

"එහෙම නං - මම යන්නං."

"හොඳයි. ගුඩ් ලක්." ගිල්බා දිසාවිල පුරුද්දට මෙන් කීවාය.

බිමල් දොර වෙතට ආවේය. ගෙතුළට එනවිට පසෙක තැබූ ගමන් මල්ල පිට බැඳගෙන පිලට ආවේය. කුඩය තවමත් තිබූ තැනම දිග හැර තිබිනි. වැස්ස නැවතුණු බැවින් ඔහු එය අකුලා අතගේ ලා ගත්තේය.

ඔහු දොර දිහාව බලන විට ඇල්ෆි එතැන සිටගෙන සිටියේය.

"මං යනවා ඇල්පි."

ඇල්පිගෙන් පිළිතුරක් නොවීය. ඇල්පි හරියටම කඳුළු පිරි දෑසින් යුතු බලු කුක්කෙක් මෙන් නොවේද? මුහුණේ සිනාවක්වත් නැත. දෑසෙහි දීප්තියක් - නැත.

බිමල් ඉස්තෝප්පුවෙන් මිදුලට බසින විටම, ගෙතුලින ඔරලෝසුවක හඬේ කර්කශම නාද බෙදු ඇසුනි. වෙලාව - ගමන් යන් ඉක්මන! තමා, ගිල්ඩා දිනුවල සමඟ කොතරම් කාලයක් ගත කළාදැයි බිමල්ට නිච්චියක් නොවීය.

ඔහු අන්දර වැට අතරින් ගේට්ටුව වෙතට ගමන් ගන්නා අතර ගෙතුලින පියානෝ වාදනය යළින් ඇරඹුනි ඇල්පි බිමල්ට මඳක් පසු පසින් ඇවිද ආවේය.

බිමල් ගේට්ටුව වෙතට එන්ට, ඇල්පි ඔහු සමඟා ගේට්ටුව හැර දුන්නේය.

ගේට්ටුවෙන් පිටත රෝස පැහැ කබායක් හැඳගත් දස හැවිරිදි තරම් දැරියක් බලා සිටියාය. ඇගේ දෙකොපුලත් රෝස පැහැයක් විය. හරියටම අර වැගි කබායේ පාට ඇගේ මුහුණට වැදුනාක් මෙනි. මේ ගිල්ඩාගෙන් පියානෝ වාදනය උගෙන ගන්නට ආ දැරියක් විය යුතු යැයි බිමල් සිතුවේය.

පාරේ නවතා තිබූ රථයක සිටියෙකුට අත වැනූ දැරිය ගේට්ටුවෙන් ඇතුළු වූවාය.

ගේට්ටුවෙන් ඇතුළුවූ ඇල්පි ගේට්ටුව වැසුවේය.

පාරේ තිබූ රථය ගමන් යන් අතරම, බිමල් පය ඉක්මන් කළේ අරමුණක් නොරවය.